# රට ගිය ශ්‍රමිකයන්ගේ අගය සංඛ්‍යාලේඛන වලට පමණක් සීමා කරන්න බෑ.......

## දූ දරුවන් වෙනුවෙන් සුභසාධනය තවදුරටත් ව්‍යාප්ත කරනවා.....

### ඇමතිනී නීතීඥ තලතා අතුකෝරල කියයි.

විදේශ රැකියා සඳහා පිටත්ව ගිය අයගේ සංඛ්‍යා ලේඛන මඟින් ආර්ථිකය දියුණු වූවා යැයි කීම වචන වලට පමණක් සීමා නොකළ හැකි බවත්, ඔවුන් වෙනුවෙන් සුභසාධන පහසුකම් හා සමාජ ආරක්ෂණය තහවුරු කර එහි ප්‍රතිලාභ ලබා දීම කළ යුතු බව විදේශ රැකියා අමාත්‍ය නීතීඥ තලතා අතුකෝරල මහත්මිය ප්‍රකාශ කළාය. විදේශ විනිමය ඩොලර් වලින් ලැබීම සංඛ්‍යා ලේඛන මඟින් පමණක් ඉදිරිපත් කිරීමෙන් හෝ, කාන්තාවන් රට යන ප්‍රමාණය අඩු කිරීමෙන් හෝ විගමණික පවුල් වල සුභසාධනය ඉහල නැංවිය නොහැකි බවද, ඇය සඳහන් කළාය. විදේශ රැකියා ලාභීන්ගේ දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ ගම්පහ දිස්ත්‍රික් උත්සවයට සහභාගිවෙමින් ඇය මෙම අදහස් ප්‍රකාශ කළාය.

2013/2014 වර්ෂවල විදේශ සේවා කාර්යාංශයේ ලියාපදිංචි වී එතෙර රැකියා සඳහා ගිය දෙමාපියන්ගේ දූ දරුවන් සඳහා කාර්යාංශය ශිෂ්‍යත්ව 4400 ක් පිරිනමන අතර, ඒ සඳහා රුපියල් අටකෝටි හතලිස්පන් ලක්ෂ හැත්තෑපන්දහසක් (රු.84,575,000) කාර්යාංශය වැය කරයි. මෙහිදී ගම්පහ දිස්ත්‍රික් විගමණික ශ්‍රමිකයන්ගේ දූ දරුවන් 516 දෙනෙකු සඳහා ශිෂ්‍යත්ව අමාත්‍යතුමිය අතින් පිරිනැමිණි. ඒ සඳහා රු.එක්කෝටි තිස්පන්දහසක් වැය කර තිබේ. පහ වසර ශිෂ්‍යත්ව විභාග සමත් සිසුන් 187 ක් අ.පො.ස (සා.පෙළ) සමත් 264 ක් හා උසස් පෙළ සමත් 65 දෙනෙකු ඒ අතර වේ. පිළිවෙලින් එක් අයෙකුට රු.15,000, 20,000 හා 30,000 බැගින් ශිෂ්‍යත්ව පිරිනැමිණි.

වැඩිදුරටත් අදහස් දක්වූ අමාත්‍යතුමිය, "රටට ආදායම් ගෙනෙන රට ගිය මේ පිරිස ඉටු කරන සේවය අපි අගය කරන්න ඕනි. ගරු ජනාධිපතිතුමා දින 100 වැඩපිළිවෙල යටතේ විගමණික ශ්‍රමිකයන්ට සුභසාධන පහසුකම් වැඩිකරන්න යෝජනා කලා. එය අපි දැනටමත් ක්‍රියාත්මක කරනවා. ඒ වගේම විගමණික පවුල් වල සුභසාධනය තුළින් ප්‍රතිලාභ ඔවුන්ට සෘජුවම ලැබෙන ක්‍රමයක් ක්‍රියාත්මක කරනවා. සුභසාධනය සැලසීම සඳහා යොදවන වියදම් අපතේ යාමට ඉඩ නොදීමට අපි වගබලා ගන්නවා. එම වියදම් වල ප්‍රතිලාභ සෘජුවම විගමණික පවුල් වල දූ දරුවන්ට ලබා දීමට කටයුතු කිරීම අපේ යහපාලනයේ වගකීමක්."

අමාත්‍යතුමිය එහි රැස්ව සිටි සිසු සිසුවියන්ගෙන් ඉල්ලා සිටියේ, යහපත් පුරවැසියන් ලෙස මව්බිමට කීර්තිය ගෙනදීම සඳහා අධ්‍යාපනය හොඳින් කරන ලෙසයි. මව හෝ පියා ලඟ නොමැති අඩුව තාමත් දරුවන්ට දැනෙන බවත්, එසේ වුවත් තම අධ්‍යාපන අරමුණු ඉටු කර ගැනීමට නිරන්තරයෙන්ම වෙහෙසිය යුතු බවද, ඇය සඳහන් කළාය. "මෙතැන ඉන්න හැම දරුවෙක්ම දක්ෂයි. හැමෝම හිතන්න

ඕන තමන් දක්ෂ බව එවිට ලෝකයේ අභියෝග ජයගන්න ලේසියි. මාත් නිදහස් අධ්‍යාපනයෙන් ආව කෙනෙක්.නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිලාභ ලැබූ අපි මේ රටට උපරිමයෙන්ම සේවය කරන්න ඕන.අම්මලා තාත්තලා පිටරට ඉඳන් ඉටුකරන මෙහෙය අතිවිශිෂ්ඨයි. ඒ වෙනුවෙන් ඔබ කරන්න ඕන හොඳට ඉගෙන ගෙන රට වෙනුවෙන් වැඩ කරන්න." යැයිද අමාත්‍යවරිය වැඩිදුරටත් ප්‍රකාශ කළාය.

මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී (එ.ජා.ප) අජිත් මාන්නපෙරුම, බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරුන් වන ජෝර්ජ් පෙරේරා, ශිරන්ත අමරසේකර,රෝස් ප්‍රනාන්දු, අමාත්‍යංශ ලේකම් ජී.එස් විතානගේ කාර්යාංශ සභාපති නීතිඥ නන්දපාල වික්‍රමසූරිය යන මහත්ම මහත්මීන්ද එක් වී සිටියහ.